(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **24.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 පෙබරවාරි 21 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(මහාචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **මංජුල සුරවීර ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**

ගරු **ඔෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **උපුල් කිත්සිරි මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු **චමින්ද ලලිත් කුමාර මහතා**

ගරු **නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු  අජිත් පී. පෙරේරා මහතා

ගරු  කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු  නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු  ලාල් ප්‍රේමනාත් මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු  නන්ද බණ්ඩාර මහතා

ගරු  ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු  සුදත් බලගල්ල මහතා

ගරු  (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු  ඊ.එම්. බස්නායක මහතා

ගරු  සුනිල් බියන්විල මහතා

ගරු  (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු  ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු  ජගත් මනුවර්ණ මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  චානක මාදුගොඩ මහතා

ගරු  රුවන් මාපලගම මහතා

ගරු  ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු  සංජීව රණසිංහ මහතා

ගරු  ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු  මංජුල සුගත් රත්නායක මහතා

ගරු  සුරංග රත්නායක මහතා

ගරු  ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු  අසෝක සපුමල් රන්වල මහතා

ගරු  තුරෛරාසා රවිකරන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු  මනෝජ් රාජපක්ෂ මහතා

**ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

**ගරු වරුණ ලියනගේ මහතා**

**ගරු කංචන වැලිපිටිය මහතා**

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මා වෙත ලද පැමිණිලි සැලකිල්ලට ගෙන ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු හේමාලි වීරසේකර මහත්මියගේ සභාපතිත්වයෙන්, ගරු විජිත හේරත් මහතාගේ සහ ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ සාමාජිකත්වයෙන් යුත් මා විසින් පත් කරන ලද විශේෂ කමිටුවේ වාර්තාව සභාගත කරමි. තවද, මෙම වාර්තාව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන බව දන්වනු කැමැත්තෙමි."

**II**

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලමින් වරින් වර මා වෙත යොමු කරන ලද ඉල්ලීම් පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව, ඒ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩ බලන පොලිස්පතිවරයා වෙත එම ඉල්ලීම යොමු කර ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) ඉඹුල්ගොඩ, අමුණුගොඩ, කළුවල පාර, අංක 3බී දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඩී. ප්‍රේමතිලක මහතාගෙන් ලැබුණු 2024.12.16 දිනැති පෙත්සම ගරු ඩී. වී. චානක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කොට්ටුකච්චිය, පුරාණගම යන ලිපිනයෙහි පදිංචි එන්. සී. එස්. ප්‍රේමලාල් මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු 2024.11.22 දිනැති පෙත්සම ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ඇඹිලිපිටිය, මොරකැටිය, නුගේ හරස් පාර, අංක 3393/5 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු 2024.11.27 දිනැති පෙත්සම ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) අලව්ව, පහළ වලකුඹුර, බලගල්ල වත්ත යන ලිපිනයෙහි පදිංචි ඩී. ජී. ධර්මසිරි මහතාගෙන් ලැබුණු 2024.12.09 දිනැති පෙත්සම; සහ

(ii) අලව්ව, පහළ වලකුඹුර, අංක 312/3 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එච්. ජී. හේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2024.12.22 දිනැති පෙත්සම

ගරු අශෝක ගුණසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) බණ්ඩාරගම, අටුළුගම, අඹගහවත්ත, අංක 52/ඩී දරන ස්ථානයෙහි පදිංචි අබ්දුල් රසීදු පාතුම්මා රාණි මහත්මියගෙන් ලැබුණු 2025.01.08 දිනැති පෙත්සම;

(ii) පයාගල, කච්චාගොඩ යන ලිපිනයෙහි පදිංචි ඩී. එස්. විජේසේකර මහතාගෙන් ලැබුණු 2025.01.20 දිනැති පෙත්සම;

(iii) නාගොඩ, බෝඹුවල පාර, පරණ පොලිස් වත්ත, අංක 49 දරන ස්ථානයෙහි පදිංචි ඊ. ඩී. නන්දසිරි මහතාගෙන් ලැබුණු 2025.01.21 දිනැති පෙත්සම;

(iv) පානදුර, පිටවල, අළුබෝගාවත්ත, අංක 11/7 ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. ලලිත් කුමාර මහතාගෙන් ලැබුණු 2024.12.16 දිනැති පෙත්සම;

(v) කළුතර, කලමුල්ල, 29 කණුව අසල යන ලිපිනයෙහි පදිංචි එම්. පී. ජයසේකර මහතාගෙන් ලැබුණු 2024.12.02 දිනැති පෙත්සම;

(vi) පොකුණුවිට, හේනේගම, බණ්ඩාරවත්ත, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි නුවන් මුහන්දිරම් මහතාගෙන් ලැබුණු 2025.01.08 දිනැති පෙත්සම;

(vii) බොරලැස්ගමුව, වැව පාර, එගොඩවත්ත පාර, අංක 23/30 දරන ස්ථානයෙහි පදිංචි තිලකා හේවාවිතාරණ මහත්මියගෙන් ලැබුණු 2024.12.11 දිනැති පෙත්සම; සහ

(viii) වාද්දුව, හබරලගහලන්ද, සඳකැලුම් මාවත, අංක 65 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. ගාමිණී නානායක්කාර මහතාගෙන් ලැබුණු 2025.01.07 දිනැති පෙත්සම

ගරු නන්දන පත්මකුමාර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) රඹුක්කන, හුරීමළුව, මස්කඩේ වත්ත, අංක ඩී 92/2 දරන ස්ථානයෙහි පදිංචි අකුරන්ගේ චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු 2025.01.09 දිනැති පෙත්සම;

(ii) ගෝනවිල, මාකඳුර (වයඹ), පන්සල පාර, අංක 349 දරන ස්ථානයෙහි පදිංචි බී. ඒ. ඒ. විමලවීර මහතාගෙන් ලැබුණු 2024.12.13 දිනැති පෙත්සම;

(iii) පිළියන්දල, මාම්පේ, වවනවත්ත පාර, අංක 306/බී දරන ස්ථානයෙහි පදිංචි ජී. පී. ටී. පී. වීරසේකර මහත්මියගෙන් ලැබුණු 2024.12.02 දිනැති පෙත්සම;

(iv) ගනේමුල්ල, ගලහිටියාව, අංක 139 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඒ. රංජිත් මහතාගෙන් ලැබුණු 2024.12.20 දිනැති පෙත්සම;

(v) රාගම, වල්පොල, උග්ගස්හේන, අංක 44/8 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ඒ. යූ. ඒ. පෙරේරා මහතාගෙන් ලැබුණු 2024.12.06 දිනැති පෙත්සම;

(vi) නිට්ටඹුව, රන්පොකුණුගම 11 අදියර, අංක එෆ්/226 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ආර්. එස්. රූපසිංහ මහතාගෙන් ලැබුණු 2025.01.06 දිනැති පෙත්සම;

(vii) කොටුගොඩ, මිලේනියම් සිටි, කලාප 01, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. ක්‍රිෂාන්ති ෂ්‍යාමිනි මහත්මියගෙන් ලැබුණු 2025.01.06 දිනැති පෙත්සම;

(viii) ගම්පහ, පෙතියාගොඩ, ඇහැලගහහේන, අංක 448 එන් 6 දරන ස්ථානයෙහි පදිංචි පී. සී. එස්. වීරසූරිය මහතාගෙන් ලැබුණු 2024.12.20 දිනැති පෙත්සම;

(ix) වේයන්ගොඩ, එස්සැල්ල, නයිවල, ජන උදාන ගම, අංක 92 දරන ස්ථානයෙහි පදිංචි පී. ඩී. එන්. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2024.12.19 දිනැති පෙත්සම;

(x) රාගම, වල්පොල පාර, අංක 128 දරන ස්ථානයෙහි පදිංචි පී. ඩී. පී. කුමාර ධර්මසේන මහතාගෙන් ලැබුණු 2025.01.07 දිනැති පෙත්සම;

(xi) මාබොදල, මාබොදල වත්ත, අංක 154/3/සී දරන ස්ථානයෙහි පදිංචි ආර්. ඒ. එම්. රණබාහු මහතාගෙන් ලැබුණු 2025.01.03 දිනැති පෙත්සම;

(xii) දෙවලපොළ, වල්පිටමුල්ල, අංක 137/1 බී දරන ස්ථානයෙහි පදිංචි ටී. ඒ. අයිරාංගනී මහත්මියගෙන් ලැබුණු 2024.12.13 දිනැති පෙත්සම; සහ

(xiii) වැබඩ (උතුර), අංක 397/1 දරන ස්ථානයෙහි පදිංචි විජිතා කුමාරි වීරසූරිය මහත්මියගෙන් ලැබුණු 2024.12.13 දිනැති පෙත්සම

ගරු රුවන් මාපලගම මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) බෙලිගල, ඉහළ කලුගල, කරපනේ හංදිය යන ලිපිනයෙහි පදිංචි බී. එස්. විජේකෝන් කුලතුංග මහතාගෙන් ලැබුණු 2024.12.09 දිනැති පෙත්සම; සහ

(ii) කොටියාකුඹුර, මත්තමගොඩ, 'රත්නවාස', අංක ඒ 432, දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඩී. වික්‍රමනායක මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම

ගරු කංචන වැලිපිටිය මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) නාවල, කොස්වත්ත පාර, අංක 160/4 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එස්. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබුණු 2024.12.19 දිනැති පෙත්සම;

(ii) හෝමාගම, පිටිපන උතුර, අංක 50/1 දරන ස්ථානයෙහි පදිංචි කේ. කේ. මාතාංග පෙරේරා මහතාගෙන් ලැබුණු 2024.12.07 දිනැති පෙත්සම;

(iii) පන්නිපිටිය, ඇරැව්වල, බෝකුන්දර පාර, අංක 525/1 සී දරන ස්ථානයෙහි පදිංචි කේ. එස්. අතුල මහතාගෙන් ලැබුණු 2024.12.18 දිනැති පෙත්සම;

(iv) හොරණ, නර්තනගල, 03 වන අදියර, අංක 81 දරන ස්ථානයෙහි පදිංචි එන්. එස්. රත්නවීර මහතාගෙන් ලැබුණු 2025.01.06 දිනැති පෙත්සම;

(v) හම්බන්තොට, මිරිජ්ජවිල, අඩි 100 පාර, අංක 261 දරන ස්ථානයෙහි පදිංචි පී. ලොකුහෙට්ටි මහතාගෙන් ලැබුණු 2025.01.18 දිනැති පෙත්සම;

(vi) කෝට්ටේ, මාදිවෙල, සිගේරා පාර, අංක 115/1/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්. උපුල් නිශාන්ත මහතාගෙන් ලැබුණු 2024.12.02 දිනැති පෙත්සම; සහ

(vii) පන්නිපිටිය, පරණ පාර, අංක 32, වත්තේගෙදර බාහිර තැන්පත්කරුවන්ගේ සමිතියේ සාමාජිකත්වය දරන සුසිල් විජයරත්න මහතාගෙන් ලැබුණු 2025.01.20 දිනැති පෙත්සම

ගරු දේවානන්ද සුරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(5)හි විධිවිධාන ප්‍රකාරව, 2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා, 28 සිකුරාදා සහ 2025 මාර්තු 01 සෙනසුරාදා, 03 සඳුදා, 04 අඟහරුවාදා, 05 බදාදා, 06 බ්‍රහස්පතින්දා, 07 සිකුරාදා, 08 සෙනසුරාදා, 10 සඳුදා, 11 අඟහරුවාදා, 12 බදාදා, 14 සිකුරාදා, 15 සෙනසුරාදා, 17 සඳුදා, 18 අඟහරුවාදා, 19 බදාදා, 20 බ්‍රහස්පතින්දා සහ 21 සිකුරාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා සහ 2025 මාර්තු 01 සෙනසුරාදා, 03 සඳුදා සිට 06 බ්‍රහස්පතින්දා දක්වා, 08 සෙනසුරාදා, 10 සඳුදා සිට 12 බදාදා දක්වා, 15 සෙනසුරාදා සහ 17 සඳුදා සිට 20 බ්‍රහස්පතින්දා දක්වා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 පෙබරවාරි 28 සිකුරාදා, 2025 මාර්තු 07 සිකුරාදා සහ 14 සිකුරාදා යන වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 මාර්තු 21 සිකුරාදා වෙන් කළ දිනයෙහි පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. විසර්ජන පනත් කෙටුම්පත — (සිව්වැනි වෙන් කළ දිනය):** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2025 පෙබරවාරි 17),—

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යි ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා. 10.50 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.31 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන්, විවාදය කල් ගියේ ය; එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 22 සෙනසුරාදා පවත්වනු ලැබේ.

**8. කල් තැබීම (දුම්රියේ ගැටීමෙන් සිදුවන වන අලි මරණ වැළැක්වීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 6.30 පසුකර තිබූයෙන් අ.භා. 6.42 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 06 සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 22 සෙනසුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.